පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 12

අවසාන වාර පරීක්ෂණය - 2017

පාසලේ නම : .......................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ...............................................
.......................................................................................................

කාලය : පැය 03 යි.

# යුරෝපා ඉතිහාසය I

**යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි. ව. 1989 දක්වා**

**සැලකිය යුතුයි :**

- **මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**

Education NCP - www.edncp.lk

- **ප්‍රශ්න අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හේතුවක් නිසා හෝ අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන, එහි අංකය වරහන් තුළ ලියන්න.**

01. (1) කොර්සිකා (2) එල්බා (3) බොලොඤ්ඤා
(4) මෝල්ටා (5) සිසිලිය (............)

02. (1) රයින් (2) රෝන් (3) ටයිබර්
(4) ඩැනියුබ් (5) මිසිසිපි (............)

03. (1) ප්‍රවේණිය (2) ද්වන්ධ සටන් (3) වංශාධිපති පංතිය
(4) ස්වයංපෝෂිත ආර්ථිකය (5) ධන වාදය (............)

04. (1) ජෝන් වයික්ලිප් (2) ෆ්‍රැන්සිස් ෂේවියර් (3) ජෝන් හස්
(4) උල්රිච් ස්විංග්ලි (5) ජෝන් කැල්වින් (............)

05. (1) තීබ්ස් (2) කොරින්ත් (3) ස්පාටා
(4) ඇතැන්ස් (5) මිලාන් (............)

06. (1) රාජාණ්ඩුව (2) කතිපයාධිපති ආණ්ඩුව (3) ප්‍රජා පීඩික පාලනය
(4) පූජක තන්ත්‍රය (5) ප්‍රජාතන්ත්‍රවාදය (............)

07. (1) ඇලෙක්සැන්ඩර් (2) ඔගස්ටස් (3) ඩයොක්ලිෂන්
(4) කොන්ස්ටන්ටයින් (5) තියඩෝසියස් (............)

08. (1) විටෙන්බර්ග් (2) බ්‍රැන්ඩර්බර්ග් (3) හැප්ස්බර්ග්
(4) ඔග්ස්බර්ග් (5) වර්ටෙම්බර්ග් (............)

09. (1) අයි - ලා - චැපල් (2) ලයිබැක් (3) ට්‍රෙන්ට්
(4) වෙරෝනා (5) ට්‍රොපව් (............)

10. (1) ජෝන් ලොක් (2) ප්‍රැන්සිස් ඩ්‍රේක් (3) මොන්ටෙස්කයු
(4) රූසෝ (5) වොල්ටෙයාර් (............)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහත බැගින් දී ඇත. ඒවා අතරින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11. (1) ජෝන් කේ - දුවන නඩාව
(2) ජේම්ස් හාර්ග්‍රීව්ස් - කටින ජෙනිය
(3) රිචඩ් ආර්ක්රයිට් - ජල රාමුව
(4) ජෝර්ජ් ස්ටීවන්සන් - ආරක්ෂක පහන
(5) ජේම්ස් වොට් - වාෂ්ප එන්ජිම (............)

12. (1) නාමික හෙන්රි - නව ලෝකය සොයා ගැනීම
(2) බර්තෝලමියු ඩයස් - අප්‍රිකා මහද්වීපයේ දකුණු කුණාවට යාත්‍රා කිරීම
(3) ක්‍රිස්ටෝපර් කොලොම්බස් - බටහිර ඉන්දීය දූපත්වලට යාත්‍රා කිරීම
(4) වස්කෝ ද ගාමා - ඉන්දියාවට යාත්‍රා කිරීම
(5) ෆර්ඩිනන්ඩ් මැගලන් - ලොව වටා යාත්‍රා කිරීම (............)

Education NCP - www.edncp.lk

13. (1) වැඩවසම් ක්‍රමය - සාමූහිකත්වය
(2) පුනරුදය - මානව වාදය
(3) ජාතික රාජ්‍ය - නව රාජාණ්ඩුව
(4) ප්‍රතිරෙපරමාදුව - අධර්ම මර්දනාධිකරණය
(5) සමාජ වාදය - බද්ද ව්‍යාපාර සමාගම (............)

14. (1) තේම්ස් - ලන්ඩන්
(2) ඩැනියුබ් - වියනා
(3) එල්බ් - සරයේවෝ
(4) ටයිබර් - රෝමය
(5) විස්ටියුලා - ඩැන්සිග් (............)

15. (1) හෝමර් - වීර කාව්‍ය
(2) සොක්‍රටීස් - ජීව විද්‍යාව
(3) ඇරිස්ටෝටල් - තර්ක ශාස්ත්‍රය
(4) පයිතගරස් - ගණිතය
(5) හිපොක්‍රටීස් - වෛද්‍ය විද්‍යාව (............)

- **ප්‍රශ්න අංක 16 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුව X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන් තුළ ලියන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| (i) | මැසච්චියෝ | A | අවසන් විනිශ්චය |
| (ii) | බොටිචෙලී | B | ඇතැන්ස්හි පාසල |
| (iii) | ලෙනාර්ඩෝ ඩාවින්චි | C | වීනස්ගේ උපත |
| (iv) | මයිකල් ආංජිලෝ | D | ආදම් සහ ස්ව උද්‍යානයෙන් නෙරපීම |
| (v) | රෆායල් | E | අවසන් රාත්‍රි භෝජන සංග්‍රහය |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (............)



Education NCP - www.edncp.lk

17. X | Y

| | X | | Y |
|---|---|---|---|
| (i) | ජෝන් කැල්වින් | A | නීතිය සාරය |
| (ii) | තෝමස් හොබ්ස් | B | මිනිස් අයිතිවාසිකම් |
| (iii) | මොන්ටෙස්කියු | C | ජාතීන්ගේ ධනය |
| (iv) | ඇඩම් ස්මිත් | D | ලෙවියතාන් |
| (v) | තෝමස් පෙන් | E | ක්‍රිස්තියානි ආගමේ ආයතන |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (............)

18.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ක්ලීස්තිනීස් | A | වෛද්‍ය විද්‍යාවේ පියා |
| (ii) | හෙරඩෝටස් | B | ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදයේ පියා |
| (iii) | හිපොක්‍රටීස් | C | පළමුවන රෝම අධිරාජයා |
| (iv) | ඔක්ටේවියන් | D | මානව වාදයේ පියා |
| (v) | පෙට්රාක් | E | ඉතිහාසයේ පියා |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (............)

19.

| | X | | Y |
|---|---|---|---|
| (i) | නව ලෝකය | A | බ්‍රිතාන්‍ය |
| (ii) | භූගෝලීය ප්‍රකාශයක් පමණි. | B | ඉන්දියාව |
| (iii) | හිරු නොබසින අධිරාජ්‍යය | C | ඇමරිකා මහද්වීපය |
| (iv) | බ්‍රිතාන්‍ය කිරීටයේ මාණික්‍ය | D | තුර්කිය |
| (v) | යුරෝපයේ රෝගියා | E | ඉතාලිය |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (............)

Education NCP - www.edncp.lk

20.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ටයිබර් ගඟ | A | ඉංග්‍රීසි ඕඩය |
| (ii) | ඩැනියුබ් ගඟ | B | උතුරු මුහුද |
| (iii) | සේන් ගඟ | C | මධ්‍යධරණි මුහුද |
| (iv) | එල්බා ගඟ | D | බෝල්ටික් මුහුද |
| (v) | විස්ටියුලා ගඟ | E | කළු මුහුද |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (............)

21.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ජුපිටර් | A | මුහුදට අධිපති දෙවඟන |
| (ii) | මිනෙර්වා | B | යුද්ධයට අධිපති දෙවියා |
| (iii) | වීනස් | C | ප්‍රඥාවට හා ශිල්පයන්ට අධිපති දෙවඟන |
| (iv) | නෙප්චූන් | D | අහසට අධිපති දෙවියා |
| (v) | මාර්ස් | E | ප්‍රේමයට අධිපති දෙවඟන |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (............)

22.

| | X | | Y |
|---|---|---|---|
| (i) | හැප්ස්බර්ග් | A | ප්‍රශියාව |
| (ii) | ටියුඩර් | B | නෙදර්ලන්තය |
| (iii) | බූර්බෝන් | C | එංගලන්තය |
| (iv) | හොහෙන්සොලර්න් | D | ඔස්ට්‍රේලියාව |
| (v) | ඔරෙන්ජ් | E | ප්‍රංශය |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (............)

Education NCP - www.edncp.lk

23.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ටොලමි | A | පරිණාමවාදී න්‍යාය |
| (ii) | කොපර්නිකස් | B | සාපේක්ෂවාදී න්‍යාය |
| (iii) | අයිසැක් නිව්ටන් | C | සූර්යයා කේන්ද්‍ර කරගත් විශ්වය පිළිබඳ නියමය |
| (iv) | චාල්ස් ඩාවින් | D | පෘථිවිය කේන්ද්‍රගත විශ්වය පිළිබඳ න්‍යාය |
| (v) | ඇල්බට් අයිස්ටයින් | E | ගුරුත්වාකර්ෂණය පිළිබඳ න්‍යාය |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (............)

24.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ජෝන් වෛක්ලිෆ් | A | ලන්දේසි |
| (ii) | ජෝන් හස් | B | ඉංග්‍රීසි |
| (iii) | ඉරාස්මස් | C | ස්විස් |
| (iv) | උල්රිච් ස්විංග්ලි | D | ප්‍රංශ |
| (v) | ජෝන් කැල්වින් | E | බොහිමියන් |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (............)

25.

| | X | | Y |
|---|---|---|---|
| (i) | මිලාන් ආඥාව | A | හතරවැනි හෙන්රි |
| (ii) | මහාධිකාර පත්‍රය | B | මෙටර්නික් |
| (iii) | නැන්ට්ස් ආඥාව | C | නැපෝලියන් බොනපාට් |
| (iv) | බර්ලින් ආඥාව (මහද්වීපික ක්‍රමය) | D | කොන්ස්ටන්ටයින් |
| (v) | කාල්ස්බාඩ් ආඥාව | E | ජෝන් රජතුමා |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (............)

Education NCP - www.edncp.lk

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A) (B) (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

| | |
|---|---|
| **(A) සහ (B) පමණක් නිවැරදි නම්** | **1 ද** |
| **(B) සහ (C) පමණක් නිවැරදි නම්** | **2 ද** |
| **(C) සහ (D) පමණක් නිවැරදි නම්** | **3 ද** |
| **(A) සහ (C) පමණක් නිවැරදි නම්** | **4 ද** |
| **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම්** | **5 ද** |

**වරහන් තුළ ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A) සහ (B) පමණක් නිවැරදිය** | **(B) සහ (C) පමණක් නිවැරදිය** | **(C) සහ (D) පමණක් නිවැරදිය** | **(A) සහ (C) පමණක් නිවැරදිය** | **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය** |

26. පහත දැක්වෙන්නන් අතරින් ප්‍රංශ විප්ලවයේ නායකයෝ කවරහු ද?
    (A) කැලෝන් (B) මිරාබෝ
    (C) අබේසියෙස් (D) ටැලිරාන්ඩ් (............)

27. පහත දැක්වෙන දෑ අතරින් ප්‍රතිරෙපරමාදුවේ ප්‍රධාන අංග කවරේ ද?
    (A) ජේසු සංගමය (B) ජිනීවා හි කැල්වින්වාදී පල්ලිය
    (C) ට්‍රෙන්ට් සම්මේලනය (D) අධර්ම මර්ධනාධිකරණය (............)

28. පහත දැක්වෙන කරුණු අතරින් වැඩවසම් ක්‍රමයේ ලක්‍ෂණ කවරේ ද?
    (A) ශක්තිමත් මධ්‍යම ආණ්ඩුව (B) රදළ ප්‍රභූ පන්තිය
    (C) ප්‍රවේණිදාස පන්තිය (D) ශක්තිමත් ස්ථාවර යුද්ධ හමුදාව (............)

29. පහත දැක්වෙන ඒවා අතරින් ජාතික රාජ්‍යයක ලක්‍ෂණ කවරේ ද?
    (A) ශක්තිමත් නිත්‍ය යුද්ධ හමුදාව (B) පරමාධිකාරී රාජාණ්ඩුව
    (C) නිශ්චිත දේශ සීමාව (D) ශක්තිමත් ප්‍රාදේශීය පාලකයන් (............)

Education NCP -www.ednop.lk

30. පහත දැක්වෙන රටවල් අතරින් තිස් අවුරුදු යුද්ධයට සහභාගී වූ රටවල් කවරේ ද?

(A) ඩෙන්මාර්කය (B) ප්‍රංශය

(C) රුසියාව (D) එංගලන්තය (...........)

- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුණ තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා,

(1) ජාතික මන්ත්‍රණ සභාව ඇති කිරීම

(2) රාජාණ්ඩුව අහෝසි කිරීම හා සමූහාණ්ඩුවක් පිහිටුවීම

(3) දහඅටවන ලුවී රජතුමාට මරණ දඬුවම පැනවීම

(4) භීම සමය

(5) අධ්‍යක්ෂක මණ්ඩලයේ පාලනය (...........)

32. නැපෝලියන් බොනපාට්,

(1) නැපෝලියන් බොනපාට් ප්‍රංශයේ අධිරාජයා බවට පත් වීම

(2) ඔහු ප්‍රංශයේ දේශ සීමා පුළුල් කළේ ය.

(3) ඔහුගේ එක් කාර්ය සිද්ධියක් නම් ඒකාබද්ධ නීති පද්ධතියක් ප්‍රංශයේ ක්‍රියාත්මක කිරීම

(4) වෝටර්ලු හි දී ඔහු විසින් මිත්‍ර හමුදාව පරාජයට පත් කිරීම

(5) නැපෝලියන් බොනපාට් ප්‍රංශ විප්ලවයේ දරුවා යැයි සාමාන්‍යයෙන් සැලකීම (...........)

33. පුනරුදය,

(1) ඉතාලියෙන් ආරම්භ විය.

(2) ස්වභාවිකත්වය, එහි ප්‍රධාන ලක්ෂණ වලින් එකක් විය.

(3) මකියාවෙලි කලා හා සාහිත්‍ය කටයුතු වලට අනුග්‍රහ දැක්වීය.

(4) ඇතැම් විට පුනරුද කලාකරුවන් අතරින් ශ්‍රේෂ්ඨතමයා වූයේ ලියනාඩෝ ඩාවින්චි ය.

(5) ශ්‍රේෂ්ඨතම පුනරුද ශිල්පීන් අතරින් කෙනෙක් නම් මයිකල් ආංජලෝ ය. (...........)

Education NCP - www.edncp.lk

34. තිස් අවුරුදු යුද්ධය,

(1) ඔග්ස්බර්ග් සාම සමයේ අඩුපාඩු තිස් අවුරුදු යුද්ධය ඇතිවීමට හේතු විය.

(2) V චාල්ස් අධිරාජයා මෙම යුද්ධයට සහභාගි විය.

(3) මෙම යුද්ධයෙන් ප්‍රංශය ජය ලැබීය.

(4) ශුද්ධ රෝම අධිරාජයා මෙම යුද්ධයෙන් පරාජයට පත් විය.

(5) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම යුරෝපයේ ආගමික යුද්ධය අවසන් කළේ ය. (............)

35. දේශ ගවේෂණ,

(1) බර්තෝලමියු ඩයස් දකුණු අප්‍රිකානු තුඩුවට පැමිණීම

(2) ක්‍රිස්ටෝපර් කොලොම්බස් නව ලෝකය සොයා ගැනීම

(3) කබ්රාල් නිව්ෆවුන්ඩ්ලන්තයට ගොඩ බැසීම

(4) වස්කෝ ද ගාමා කැලිකට් කරා පැමිණීම

(5) මැගලන් ලෝකය වටා යාත්‍රා කිරීම (............)

- **ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගල දැයි තෝරා, ඊට අදාළ අංකය වරහන් තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය | වැරදි ය |
| 2 | නිවැරදි ය | නිවැරදි ය |
| 3 | වැරදි ය | වැරදි ය |
| 4 | වැරදි ය | නිවැරදි ය |
| 5 | නිවැරදි ය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දේ |

Education NCP - www.edncp.lk

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | පුරාණ ග්‍රීකයෝ යුරෝපයේ බුද්ධිවාදී සහ මානවවාදී සම්ප්‍රදායන් ආරම්භ කළහ. | මහා ඇලෙක්සැන්ඩර් රජතුමා රෝම අධිරාජ්‍යයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයා විය. | (............) |
| 37. | දේශපාලන වැඩවසම් ක්‍රමය ප්‍රධාන වශයෙන් දේශපාලන බලය විකේන්ද්‍රණය වූ ක්‍රමයකි. | වැඩවසම් රදළ ප්‍රධානීන් තම ආධිපත්‍යය තහවුරු කරගැනීම සඳහා ද්වන්ධ සටන්වල නිරත විය. | (............) |
| 38. | සෑම කුමාරයෙකුටම සිය රාජ්‍යයේ ආගම් ලෙස ලූතර්වාදය හෝ කතෝලික ආගම හෝ තෝරා ගැනීමේ අයිතිය ඔග්ස්බර්ග් සාම ගිවිසුමෙන් පිළිගනු ලැබීය. | ඔග්ස්බර්ග් සාම ගිවිසුම කතෝලික සභාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ට්‍රෙන්ට් සම්මේලනය කැඳවීමට මඟ පෑදීය. | (............) |
| 39. | 1789 ට පෙර ප්‍රංශ රදළ පන්තිය වරප්‍රසාද ලත් පිරිසක් විය. | පූර්ව විප්ලවීය ප්‍රංශයේ, රදළයෝ, පල්ලියේ, හමුදාවේ සහ ආණ්ඩුවේ ඉහළම තනතුරු දැරීය. බොහෝ බදු වලින් නිදහස් වූ ඔවුහු ගොවීන්ගෙන් වැඩවසම් බදු එකතු කර ගත්හ. | (............) |
| 40. | 1774 දී ප්‍රථම මහද්වීපික සම්මේලනයේ දී පවත්වන ලද සුප්‍රසිද්ධ තේ සාදය "බොස්ටන් තේ සාදය" නමින් හැඳින්වේ. | ඇමරිකානු විප්ලවයේ දී ඇමරිකානුවෝ නිදහස, සමානාත්මතාව හා සහෝදරත්වය යන සටන් පාඨය යටතේ ඉංග්‍රීසීන්ට විරුද්ධ ව සටන් කළහ. | (............) |

Education NCP - www.edncp.lk

***

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# අවසාන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය / ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ..............................................
.................................................................................................................... කාලය : පැය 03 මි. 10 යි.

## යුරෝපා ඉතිහාසය (25B) - I පත්‍රය

(ඈත අතීතයේ සිට ක්‍රි. ව. 1989 දක්වා)

**සැලකිය යුතුයි :**

- ❖ **මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- ❖ **එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහ බැගින් දී ඇති නමුත් නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- ❖ **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- ❖ **කොටස් දෙකටම මුළු කාලය පැය 03 මි. 10 කි. පිළිතුරු ලියා අවසන් වූ පසු I කොටස, II කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාරදෙන්න.**

### I කොටස

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

01. (1) ටයිබර් (2) තේම්ස් (3) ටාගුස්
(4) විස්ටියුලා (5) කීල් (................)

02. (1) අයෝනියන් මුහුද (2) ඊජියන් මුහුද (3) කැරිබියන් මුහුද
(4) ඇඩ්‍රියාතික් මුහුද (5) මධ්‍යධරණී මුහුද (................)

03. (1) තීබ්ස් (2) මෙගාරා (3) මර්මරා
(4) කොරින්ත් (5) මිලේටස් (................)

04. (1) සියුස් (2) මිනර්වා (3) ඇතීනා
(4) ඇෆ්‍රොඩයිටි (5) ඇපලෝ (................)

Education NCP - www.edncp.lk

05. (1) හිපොක්‍රටීස් (2) පැරසල්සස් (3) මයිකල් සර්වේටස්
(4) තෝමස් මුවර් (5) විලියම් හාවේ (................)

06. (1) තේලීස් (2) ඇනෙක්සිමැන්ඩර් (3) වර්ජිල්
(4) පයිතගරස් (5) ආකිමිඩීස් (................)

07. (1) අධිරාජ්‍ය (2) කතිපයාධිපති ආණ්ඩුව
(3) ප්‍රජා පීඩක පාලනය (4) රාජාණ්ඩු
(5) ප්‍රජාතන්ත්‍රවාදය (................)

08. (1) ජෝන් වෙක්ලිප් (2) ජෝන්හස් (3) මාටින් ලූතර්
(4) ඉග්නේෂස් ලොයෙලා (5) ජෝන් කැල්වින් (................)

09. (1) ජොයිලට් (2) නාවික හෙන්රි (3) ලාසලේ
(4) මාර්ක්විටේ (5) හෙන්රි හඩ්සන් (................)

10. (1) යුදෙව්වෝ (2) විසිගොත්වරු
(3) ඔස්ට්‍රාගොත්වරු (4) ඇන්ග්ලෝ - සැක්සන්වරු
(5) වැන්ඩල්වරු (................)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතරින් එක යුගලයක පද එකිනෙක නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

11. (1) පෙළපොනේසියානු යුද්ධය - ඇතැන්ස් හා ස්පාටා
(2) පියුනික් යුද්ධය - රෝමය හා කාර්තේජය
(3) කුරුස යුද්ධය - ක්‍රිස්තියානි භක්තිකයන් හා මුස්ලිම්වරුන්
(4) සියක් අවුරුදු යුද්ධය - එංගලන්තය හා ප්‍රංශය
(5) ඇමරිකානු නිදහස් සටන - ඇමරිකාව හා ස්පාඤ්ඤය (................)

12. (1) බර්තොලමියු ඩයස් - අප්‍රිකාවේ දකුණු තුඩුවට යාත්‍රා කිරීම
(2) වස්කෝ ද ගාමා - කැලිකට් වෙත යාත්‍රා කිරීම
(3) ක්‍රිස්ටෝපර් කොලොම්බස් - කැරිබියන් දූපත්වලට ගොඩ බැසීම
(4) ෆ්‍රැන්සිස් ඩ්‍රේක් - මෙක්සිකෝව යටත් කිරීම
(5) ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ - පේරු යටත් කිරීම (................)

13. (1) සියුස් - ජුපිටර්
(2) ඇතීනා - මිනෙර්වා
(3) ඇපලෝ - ආර්ටිමීස්
(4) ඇප්‍රොඩයිට් - වීනස්
(5) පොසීඩන් - නෙප්චූන් (................)

Education NCP - www.edncp.lk

14. (1) වැඩවසම් ක්‍රමය - සාමූහිකත්වය
(2) පුනරුදය - මානව වාදය
(3) ජාතික රාජ්‍ය - නව රාජාණ්ඩුව
(4) ප්‍රතිරෙපරමාදුව - අධර්ම මර්ධනාධිකරණය
(5) සමාජවාදය - බද්ධ ව්‍යාපාර සමාගම් (................)

15. (1) ස්ෆෝසා - මිලාන්
(2) මෙඩිචි - ෆ්ලෝරන්ස්
(3) එස්තේ - ෆෙරාරා
(4) වැලෝයි - නේපල්ස්
(5) ගොන්සාගා - මාන්ටුවා (................)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරය X තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන් තුළ ලියන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | නිකලස් කොපර්නිකස් | A | පරිනාමවාදි න්‍යාය |
| 2. | අයිසැක් නිව්ටන් | B | රේඩියම් සොයා ගැනීම |
| 3. | චාල්ස් ඩාවින් | C | සූර්ය කේන්ද්‍ර වාදය |
| 4. | මාරි කියුරි | D | සාපේක්ෂවාදී න්‍යාය |
| 5. | ඇල්බට් අයින්ස්ටයින් | E | ගුරුත්වාකර්ෂණය පිළිබඳ න්‍යාය |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (................)

17.

| | X | | Y |
|---|---|---|---|
| 1. | පාර්තිනෝන් | A | මොස්කව් |
| 2. | කොලෝසියම් | B | පැරිස් |
| 3. | ශාන්ත පීටර් බැසිලිකාව | C | රෝමය |
| 4. | ක්‍රෙම්ලින් | D | ඇතැන්ස් |
| 5. | අයිෆල් | E | වතිකානුව |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (................)

Education NCP - www.edncp.lk

18. **X** | **Y**

| | X | | Y |
|---|---|---|---|
| 1. | මිලාන් ආඥාව | A | කතෝලික ආගම, ප්‍රංශ ජනතාවගේ බහුතරයක්ගේ ආගම ලෙස පිළිගැනීම |
| 2. | ඔග්ස්බර්ග් සාම ගිවිසුම | B | නීත්‍යානුකූල වාදය පිළිබඳ මූලධර්මය |
| 3. | 1801 කොන්කොඩට් සම්මුති | C | ක්‍රිස්තියානින්ට ආගමික නිදහස ප්‍රදානය කිරීම |
| 4. | වියනා සම්මේලනය | D | ජාතික ස්වයං තීරක අයිතිය පිළිබඳ මූලධර්මය |
| 5. | වර්සායි ගිවිසුම් | E | යමෙක්, රාජ්‍ය කරයි ද, ඔහුගේ ආගම රටවැසියාගේ ද ආගම විය යුතුය. |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (................)

19.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ප්ලේටෝ | A | "කුමාරයා, සිංහයා සහ හිවලා අනුකරණය කළ යුතුයි" |
| 2. | ඇරිස්ටෝටල් | B | "වැඩිම සංඛ්‍යාවකගේ වැඩිම සතුට" |
| 3. | මකියාවෙලි | C | "බලතල පංගු කිරීමේ න්‍යාය" |
| 4. | මොන්ටෙස්ක්‍යු | D | "මිනිසා දේශපාලන සත්වයෙකි" |
| 5. | ජෙරමි බෙන්තම් | E | "දාර්ශනිකයන් පාලකයන් විය යුත්තාහ" |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (................)

20.

| | X | | Y |
|---|---|---|---|
| 1. | මිලාන් ආඥාව | A | පාලනය කරන්නේ යමෙක් ද ඔහුගේ ආගම රටවැසියාගේ ද ආගම ද විය යුතුය. |
| 2. | නැන්ට්ස් ආඥාව | B | කතෝලික ආගම ප්‍රංශයේ බහුතරයකගේ ආගම ලෙස පිළිගැනීම |
| 3. | ඔග්ස්බර්ග් සාම ගිවිසුම | C | ක්‍රිස්තියානි භක්තිකයන්ට ආගමික නිදහස ප්‍රදානය කිරීම |
| 4. | 1801 කොන්කොඩාට් සම්මුතිය | D | වතිකානුව ස්වෛරී ජනරජයක් ලෙසත් කතෝලික ආගම ඉතාලියේ රාජ්‍ය ආගම ලෙස පිළිගැනීම |
| 5. | ලැටරන් ගිවිසුම | E | ප්‍රංශයේ ප්‍රොතෙස්තන්තවාදීන්ට ආගමික නිදහස ප්‍රදානය කිරීම |

(1) DCEAB (2) CEABD (3) DEACB
(4) BEACD (5) EDACB (................)

Education NCP - www.edncp.lk

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාව යටතේ කරුණු 05 බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාල මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාල අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

21. බැබිලෝනීයානු අත් අඩංගුව
    1. බැබිලෝනියාව රෝමයට අයත්වීම.
    2. පාප්වරුන් ප්‍රංශයේ වාසය කළ කාලය.
    3. තුර්කිවරු යුරෝපයේ ආධිපත්‍ය පැතිරවීම.
    4. කතෝලික සභාවේ බලය ව්‍යාප්ත වීම.
    5. රජවරුන් පාප් රාජ්‍ය අත්පත් කර ගැනීම. (..........)

22. ප්‍රතිරෙපරමාදුව
    1. කතෝලික සභාව කොටස් වලට බිඳී යාමයි.
    2. නව නිකායන් විසින් ආගමික ප්‍රතිසංස්කරණ සිදු කිරීමයි.
    3. නව නිකායන්ගෙන් කතෝලික සභාවට එල්ල වූ අභියෝගවලට ගත් ක්‍රියාමාර්ග
    4. රෙපරමාදු ආගම් නව ව්‍යවස්ථා සකස් කිරීමයි.
    5. කතෝලික සභාවට එරෙහිව රෙපරමාදු ආගම්ගත් ක්‍රියාමාර්ගයි. (..........)

23. එංගලන්ත තුළ කාර්මික විප්ලවය ඇති වීම
    1. එංගලන්තය තුළ වැඩ වසම් ක්‍රමය බිඳවැටීම.
    2. රට තුළ ස්වාභාවික සම්පත් තිබීම.
    3. යටත් විජිත වලින් අමු ද්‍රව්‍ය පහසුවෙන් ලබා ගත හැකි වීම.
    4. භූගෝලීය වශයෙන් රට කුඩා දූපතක් වීම.
    5. ප්‍රංශ විප්ලවයේ බලපෑම් එංගලන්තයට පැමිණීම. (..........)

24. ප්‍රංශ විප්ලවය
    1. දාහතර වන ලුවීගේ රාජ්‍ය පාලන සමයේ ආරම්භ විය.
    2. රජුගේ මුදල් ඇමතියා වූ නෙකර් බදු ප්‍රතිසංස්කරණ කීපයක් යෝජනා කිරීම.
    3. ප්‍රංශ විප්ලවයට ආසන්නතම හේතුව වූයේ ප්‍රංශයේ පැවති මුදල් බංකොලොත් භාවයයි.
    4. 1789 ජූලි 14 දින බැස්ටීලයට පහර දීම ප්‍රංශ විප්ලවයේ තීරණාත්මක අවස්ථාවක් විය.
    5. නිදහස , සහෝදරත්වය , සමානාත්මතාව, ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන තේමාව විය. (..........)

25. ජාතික රාජ්‍ය ගොඩනැගීම
    1. ෆර්ඩිනන්ඩ් හා ඉසබෙලා යුවල
    2. 16 වන ලූවී රජු
    3. පළමුවැනි චාල්ස් රජු
    4. 7 වන හෙන්රි රජු
    5. හතරවන හෙන්රි රජු (..........)

Education NCP - www.edncp.lk

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ කීපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A) සහ (B) පමණක් නිවැරදි නම්** 01 ද
**(B) සහ (C) පමණක් නිවැරදි නම්** 02 ද
**(C) සහ (D) පමණක් නිවැරදි නම්** 03 ද
**(A) සහ (C) පමණක් නිවැරදි නම්** 04 ද
**ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම්** 05 ද **වරහන තුළ ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **(A) සහ (B) පමණක් නිවැරදිය.** | **(B) සහ (C) පමණක් නිවැරදිය.** | **(C) සහ (D) පමණක් නිවැරදිය.** | **(A) සහ (C) පමණක් නිවැරදිය.** | **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය.** |

26. පහත සඳහන් කරුණු අතරින් වැඩවසම් ක්‍රමයේ ලක්ෂණ මොනවා ද?
    (A) දේශපාලන බලය විකේන්ද්‍රණය වීම
    (B) පුද්ගලවාදය
    (C) ප්‍රවේණිදාසභාවය
    (D) දුර්වල රදළ ප්‍රභූ පන්තිය (................)

27. පහත දැක්වෙන්නන් අතරින් ප්‍රංශ විප්ලවයේ නායකයෝ කවරහු ද?
    (A) කැලෝන් (B) මිරාබෝ
    (C) අබේසියස් (D) ටැලිරැන්ඩ් (................)

28. පහත දැක්වෙන කෘති අතරින් ග්‍රීක වීර කාව්‍ය කවරේ ද?
    (A) ඉලියඩ් (B) ඔඩෙසි
    (C) ඇන්ටිගනි (D) ඊනිඩ් (................)

29. පහත දැක්වෙන රටවල් අතරින් පහළොස්වන හා දාසයවන සියවස්වල ජාතික රාජ්‍යයක් ලෙස නැගී ආ රටවල් කවරේ ද?
    (A) ජර්මනිය (B) ස්පාඤ්ඤය
    (C) ප්‍රංශය (D) ඉතාලිය (................)

30. පහත දැක්වෙන කරුණු අතරින් ප්‍රතිරෙපරමාදුවේ ප්‍රධාන අංග කවරේ ද?
    (A) ජර්මනියේ ලූතර්වාදී පල්ලිය (B) කතෝලික සංගමය
    (C) ට්‍රෙන්ට් සංගායනාව (D) ජේසු සංගමය (................)

Education NCP - www.edncp.lk

- **අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයක්ම එක් මාතෘකාව යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුණ තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

31. කාර්මික විප්ලවයේ ප්‍රධාන නව නිමැවුම්,
    (1) වාෂ්ප එන්ජිම (2) දුවන නඩාව (3) ස්පිනං ජෙනිය
    (4) ජල රාමුව (5) සුළං මෝල (................)

32. ප්‍රංශ විප්ලවය හා සම්බන්ධ ප්‍රධාන සිදුවීම්,
    (1) ටෙනිස් පිටියේ දිවුරුම
    (2) බැස්ටීලය බිඳ දැමීම
    (3) මිනිස් හා පුරවැසි අයිතිවාසිකම් ප්‍රකාශනය
    (4) බොස්ටන් තේ සාදය
    (5) දහසය වන ලුවී රජතුමා මරණයට පත් කිරීම (................)

33. තිස් අවුරුදු යුද්ධයේ ප්‍රධාන අවධි,
    (1) බොහිමියානු (2) ඩෙනීෂ් (3) ස්විඩීෂ්
    (4) ජර්මන් (5) ප්‍රංශ (................)

34. ජාතික රාජ්‍යයක ප්‍රධාන අංග,
    (1) ශක්තිමත් ස්ථාවර හමුදාව (2) දුර්වල රාජාණ්ඩුව
    (3) ශක්තිමත් මධ්‍යම ආණ්ඩුව (4) නිශ්චිත දේශ සීමා
    (5) ජාතික එක්සත් බව (................)

35. තිස් අවුරුදු යුද්ධය,
    (1) ආගමික විරුද්ධවාදීකම් (2) ඔග්ස්බර්ග් සමථයේ අඩුපාඩු
    (3) V චාල්ස් රජු සහභාගී වීම (4) ප්‍රංශයේ ජයග්‍රහණය
    (5) ශුද්ධ රෝම අධිරාජයාගේ පරාජය (................)

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා, ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1 | **නිවැරදි ය.** | **වැරදි ය.** |
| 2 | **නිවැරදි ය.** | **නිවැරදි ය.** |
| 3 | **වැරදි ය.** | **වැරදි ය.** |
| 4 | **වැරදි ය.** | **නිවැරදි ය.** |
| 5 | **නිවැරදි ය.** | **නිවැරදි වන අතර පළමුවැන්න, මැනවින් පහදා දෙයි.** |

Education NCP - www.edncp.lk

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|
| 36. වාණිජ වාදයේ ප්‍රධාන ලක්‍ෂණයක් නම් ආර්ථික කටයුතුවලට රජය මැදිහත් වීමයි. | වෝල්ටෙයාර් විසින් මුලින්ම වාණිජවාදී න්‍යාය ඉදිරිපත් කළේ ය. | (.........) |
| 37. ක්‍රිස්තියානීන්ට ආගමික සහනය ප්‍රදානය කරමින් කොන්ස්ටන්ටයින් ක්‍රි. ව. 313 මිලාන් ආඥාව නිකුත් කිරීම. | ක්‍රි. ව. 476 දී අවසාන රෝම අධිරාජයා බලයෙන් පහ කළ මිලේච්ඡයෝ හැනිබාල් සිහසුනට පත් කිරීම | (.........) |
| 38. පෙලපොනීසියානු යුද්ධය පිළිබඳ වංශ කථාවක් රචනා කළ තුසිඩිඩීස් ඉතිහාසයේ පියා ලෙස හඳුන්වයි. | ක්‍රි. ව. 75 සහ 85 අතර කාලයේ රෝම අධිරාජ්‍යයන් විසින් විනෝද කටයුතු සඳහා වූ ස්ථානයක් ලෙස පාර්තිනෝන් ගොඩ නගනු ලැබීය. | (.........) |
| 39. ප්‍රොතෙස්තන්ත රෙපරමාදුව යුරෝපා සමාජයේ සෑම ක්ෂේත්‍රයකම අති බලවත් හා දීර්ඝ කාලීන ප්‍රතිඵල ඇති කළේ ය. | ප්‍රොතෙස්තන්ත රෙපරමාදුව ක්‍රිස්තියානි ආගමික ඒකාබද්ධතාව අවසන් කළ අතර එය ආගමික දේශපාලන යුද්ධ ඇති වීමට මග පෑදීය. | (.........) |
| 40. මුල් කාලීන ජාතික රාජ්‍යවල ප්‍රචලිතව පැවති ආණ්ඩු ක්‍රමය නව රාජාණ්ඩු ලෙස හඳුන්වයි. | තිස් අවුරුදු යුද්ධයෙන් පසු යුරෝපයේ ආගමික යුද්ධ ඇති නොවීය. | (.........) |

Education NCP - www.ednc p.lk

***

# යුරෝපා ඉතිහාසය (25B) - II පත්‍රය

(ඈත අතීතයේ සිට ක්‍රි. ව. 1989 දක්වා)

## II කොටස

**සැලකිය යුතුයි :**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **B හා C කොටස් වලින් අවම වශයෙන් එක ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

## A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (1) | කෝර්සිකා | (2) | රයින් ගඟ |
| (3) | ලන්ඩන් | (4) | කළු මුහුද |
| (5) | ස්විස්ටර්ලන්තය | (6) | වැනීසිය |
| (7) | ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය | (8) | කීල් ඇළ |
| (9) | පෘතුගාලය | (10) | ශාන්ත පීට්ස්බර්ග් |
| (11) | වියානා | (12) | පිරනීස් |

නිවැරදිව ලකුණු කිරීම ලකුණු 01 බැගින් (ලකුණු 12)

## B කොටස

02. ග්‍රීක සංස්කෘතියේ පහත සඳහන් අංශවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

(i) ආගම

(ii) කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය

(iii) සාහිත්‍ය (ලකුණු 16)

03. (i) ඉතාලියේ පුනරුදය ආරම්භ වීමට තුඩු දුන් හේතු කවරේ ද? (ලකුණු 06)

(ii) "පුනරුදයේ බලපෑම ශාස්ත්‍රීය අංශයට මෙන්ම, විද්‍යාත්මක අංශයේ නවෝදයක් උදෙසා ද හේතු විය." මෙම කියමන පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 10)

04. (i) වැඩවසම් ක්‍රමයේ දේශපාලන, ආර්ථික සහ සමාජීය ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 08)

(ii) වැඩවසම් ක්‍රමයේ පරිහානියට හේතු වූ කරුණු පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 08)

Education NCP - www.edncp.lk

05. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) රෝම වරුන්ගෙන් ලද දායාද

(ii) ස්පාඤ්ඤයේ දේශගවේශණ කටයුතු

(iii) ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

(iv) උත්කෘෂ්ට විප්ලවය

## C කොටස

06. (i) පහළොස්වන හා දහසයවන සියවස්වල යුරෝපයේ බිහි වූ ජාතික රාජ්‍ය නැගී ඒමට තුඩු දුන් හේතු මොනවා ද? (ලකුණු 03)

(ii) ජාතික රාජ්‍යවල ප්‍රධාන ලක්ෂණ මොනවාදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(iii) ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් ලෙස වර්ධනය කිරීමෙහිලා ෆර්ඩිනන්ඩ් හා ඉසබෙලා රාජකීය යුවලගේ සේවාවන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

07. (i) ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට තුඩු දුන් ආගමික, දේශපාලනික හා ආර්ථික හේතු පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන්න. (ලකුණු 08)

(ii) "ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයෙහිලා මාටින් ලූතර්ගේ කාර්යභාරය කෙසේ වීද" විමසීමක් කරන්න. (ලකුණු 08)

08. (i) විප්ලවාසන්න ප්‍රංශයේ සිටි පාලකයා නම් කරන්න. (ලකුණු 01)

(ii) පූර්ව විප්ලවීය ප්‍රංශයේ පැවති ප්‍රජා ගණ තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) ප්‍රංශ විප්ලවයට තුඩු දුන් දේශපාලන, ආර්ථික හා සමාජීය හේතු පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 06)

(iv) ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 06)

09. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(I) ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය

(II) කාර්මික විප්ලවය

(III) ඇමරිකානු නිදහස් සටන


(IV) හිම සමය

(එක් කොටසකට ලකුණු 08 බැගින්)

(ලකුණු 16)

***

Education NCP - www.edncp.lk




Education NCP - www.edncp.lk